| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කමිටුවේ සභාපති ද ලේකම් ද, කළමනාකරුද යන වග* | *කමිටුවේ නම* | *කමිටුව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| ශිව ප්‍රකාශම් සිවරුබන් කුවිල් පුලෝලි දකුණ, පුලෝලි | ලේකම් | රෝයල් ක්‍රීඩා සමාජය | වුන්නාහම් පාර, පුත්තූර් |

අ. උදය කුමාර්,
කළමනාකරු.

2012 අගෝස්තු මස 30 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
වලිකාමම් නැගෙනහිර,
පුත්තූර්.

10-140

---

**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව**

1975 අංක 17 දරන පනතේ සමාජශාලා පනත සහ 1987 අංක 38 දරන (සංශෝධන) පනත

පහත උපලේඛනයේ සඳහන් කර ඇති අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වා ඇති සමාජශාලාව 2012 වර්ෂයේ පවත්වාගෙන යාමට බලපත්‍රයක් ලබාදෙන පනතේ 06 වැනිඩවගන්තියට අනුව ඉල්ලා ඇති බව දැනුම් දෙමි.

එම සමාජශාලාව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසළ පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයි නම් මෙම ගැසට් නිවේදනය පළකර ඇති දින සිට සති හතරක් ඉක්මයාමට පෙර ලිඛිතව පිටපත් දෙකකින් මා වෙත දැන්විය යුතු බව දන්වමි.

පුබාලසිංහම් සජීවන්,
සභාපති,
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 13 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
පේදුරුතුඩුව, පුලෝලි.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජශාලාවේ සභාපති ද ලේකම් ද, කළමනාකරු ද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| පොන්නයියාසෙල්ව ක්‍රිෂ්නන්, පුලෝලි දකුණ පුලෝලි. | ලේකම් | පුලෝලි ක්‍රීඩා සමාජය | මන්දිගෙයි, පුලෝලි දකුණ පුලෝලි. |

10-145

---

**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව**

1975 අංක 17 දරන පනතේ සමාජ ශාලා පනත සහ 1987 අංක 38 දරන (සංශෝධන) පනත

පහත උපලේඛනයේ සඳහන් කර ඇති අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වා ඇති සමාජශාලාව 2012 වර්ෂයේ පවත්වාගෙන යාමට බලපත්‍රයක් ලබාදෙන ලෙස පනතේ 06 වැනි වගන්තියට අනුව ඉල්ලා ඇති බව දැනුම් දෙමි.

එම සමාජශාලාව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසළ පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයි නම් මෙම ගැසට් නිවේදනය පළකළ දින සිට සති හතරක් ඉක්මයාමට පෙර ලිඛිතව පිටපත් දෙකකින් මා වෙත දැන්විය යුතු ය.

පී. සන්ජීවන්,
සභාපති,
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
පේදුරුතුඩුව, පුලෝලි.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජශාලාවේ සභාපති ද ලේකම් ද, කළමනාකරු ද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| කිට්ටිනන් ශිවප්‍රකාශම් පුලෝලි දකුණ, පුලෝලි | ලේකම් | රෝයල් ක්‍රීඩා සමාජය | මායක්කයි, තම්බසෙට්ටි පුලෝලි නැගෙනහිර |

10-146

---

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝඝාතකාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත්, නම ඉදිරියෙන් සඳහන් මස් වෙළඳසැලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2012 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත් ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවයක් දැක්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකුට ඔහුගේ/ඇයගේ විරෝධතාවය සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. එම්. බන්දුල සෙනෙවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

2012 අගෝස්තු මස 20 වැනි දින,
ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස් වෙළඳසැල පිහිටි ස්ථානය* | *ගෝඝාතකාරය පිහිටි ස්ථානය* |
|---|---|---|---|
| 01 | අබ්දුල් රෂිඩ් මොහොමඩ් නවාස් | 161/බුවැලිකඩ, ලීමගහකොටුව | අංක 41/5, ගවමස් වෙළඳ සැළ |
| 02 | 41/ඩී/2 එළමල්දෙණිය, මුරුතගහමුල | බුවැලිකඩ | නගර සභාව, කඩුගන්නාව |

10-316

---

**හපුතලේ නගර සභාව**

වරිපනම් බදු පැනවීම - 2013 වර්ෂය

හපුතලේ නගර සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 4:2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 හා 166 වගන්ති ප්‍රකාර, හපුතලේ නගර සභාව විසින් කරනු ලැබිය හැකි විශේෂ කොන්දේසි යටතේ, නිදහස් කිරීම්වලට යටත්ව හපුතලේ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි,

01. සියලුම නිවාස සහ මුඩු ඉඩම්වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක් ද,

02. නිවාස සහ මුඩු ඉඩම් නොවන අනෙකුත් සියලු දේපළවලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද,

03. නගර සභා සීමාවේ පිහිටි රජය සහ සංස්ථා සතු දේපළවලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දහහතරක (14%) වරිපනම් බද්දක් ද, 2013 වර්ෂය සඳහා අයකරනු ලැබේ.

04. නගර සභා ආඥාපනතේ 160(5) වගන්තිය ප්‍රකාර 2013.01.31 දින ප.ව. 3.00ට ප්‍රථම වර්ෂයට අදාළ මුළු වරිපනම් බදු මුදල ගෙවීමෙන් සියයට දහයක (10%) වට්ටමක් ලබා දෙනු ලබන බව මෙයින් දන්වමි.

උපුල් දිසානායක,
සභාපති,
නගර සභාව,
හපුතලේ.

10-308

---

## බදුල්ල මහ නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2012.08.26 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළදී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල.

2012 සැප්තැම්බර් මස 19 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

#### උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම්පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|
| 01 | ගංගානි විලේජ් මාර්ගය | හම්බාවෙල මාර්ගය | 36/11 | 36/2,36/4,36/5 36/10,36/11 | 36/24,36/21 36/16,36/14 36/18 | 155m | 4.50m |

10-378

---

## බදුල්ල මහ නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2012.08.26 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළදී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල.

2012 සැප්තැම්බර් මස 19 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම්පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | මැදපතන පරගහ ඇල්ල ගම පාර | මැදපතන වටරවුම් පාර | 83/9බී | 83/17,83/18, 83/16ආර් 83/3 83/8,83/9බී | 83/49,83/46 83/39/83/37 83/41,83/23බී 83/23සී/83/16 83/9සී | 355m | 4.50m |

10-377

---

## අයවැය ලේඛන

### කඩුවෙල මහනගර සභාව

2013 වර්ෂයේ වැඩ සටහන් අයවැය ලේඛනය

කඩුවෙල මහ නගර සභාවේ 2013 වර්ෂය සඳහා වූ වැඩ සටහන් අයවැය ලේඛනය 2012 ඔක්තෝබර් මස 29 වන දින සිට 2012 නොවැම්බර් මස 08 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කඩුවෙල මහ නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 212 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ජී. එච්. බුද්ධදාස,
නගරාධිපති,
කඩුවෙල මහ නගර සභාව.

2012 සැප්තැම්බර් මස 25 වැනි දින,
කඩුවෙල මහ නගර සභා කාර්යාලය,
කඩුවෙල.

10-387/1

### කඩුවෙල මහනගර සභාව

2012 වර්ෂයේ පරිපූරක අයවැය ලේඛනය

කඩුවෙල මහ නගර සභාවේ 2012 වර්ෂය සඳහා වූ පරිපූරක අයවැය ලේඛනය 2012 ඔක්තෝබර් මස 29 වන දින සිට 2012 නොවැම්බර් මස 08 දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කඩුවෙල මහනගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 214 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ජී. එච්. බුද්ධදාස,
නගරාධිපති,
කඩුවෙල මහ නගර සභාව.

2012 සැප්තැම්බර් මස 25 වැනි දින,
කඩුවෙල මහා නගර සභා කාර්යාලය,
කඩුවෙල.

10-387/2

---

## විවිධ දැන්වීම්

### බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2013 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 8.1 (උ) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2013 වර්ෂය සඳහා වන මෙම බද්ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2013 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අය කිරීමට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | *රු. ශත* |
| 1. (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක් | 25 0 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) සෑම ත්‍රී රෝද රථයක් සඳහා | 10 0 |
| (iv) සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (v) සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත, වෙළඳ කටයුතු සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

10-376/7

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 8.1(ඉ) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2013 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2013 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ*<br>*ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

1. පෞද්ගලික බෙහෙත් ශාලා (සිංහල)
2. පෞද්ගලික බෙහෙත් ශාලා (ඉංග්‍රීසි)
3. දන්ත චිකිත්සාගාර
4. වෛද්‍ය රසායනාගාර
5. විශේෂඥ වෛද්‍ය සේවය
6. රූපලාවන්‍ය ස්ථාන/මනාලියන් හැඩගැන්වීම
7. පරිගණක පන්ති
8. පෞද්ගලික පන්ති
9. රියැදුරු පුහුණුව
10. බැංකු
11. රක්ෂණ නියෝජිත ආයතන
12. මුද්‍රණාල
13. උකස් මධ්‍යස්ථාන
14. මූල්‍ය සමාගම්
15. රේස් ඔට්ටුපොළ
16. තුරඟ තරග මධ්‍යස්ථාන
17. උත්සව ශාලා බදු දීම
18. ඇඟළුම් කර්මාන්තශාලා
19. ටේලර් සාප්පු
20. උත්සව භාණ්ඩ බදුදීම (ටකරන් මඩු, පුටු ඇතුළුව)
21. වාහන සේවා
22. තාර පිරිසැකසුම්.

10-376/5

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 8.1 (ඇ) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2013 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව*<br>*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| *අ.අ.* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක*<br>*රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*<br>*රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක*<br>*රු. ශත* |
| 01. | සිල්ලර | 400 0 | 600 0 | 1,000 0 |
| 02. | සිල්ලර සහ සාප්පු බඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | රෙදි පිළි සහ සාප්පු බඩු | 600 0 | 800 0 | 1,000 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
|---|---|---|---|---|
| අ.අ. | කර්මාන්තයේ ස්වභාවය | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 04. | ට්‍රැක්ටර් සහ වෙනත් කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර විකිණීම | 750 0 | 1,000 0 | 3,000 0 |
| 05. | වීදුරු ගබඩා කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ප්ලාස්ටික් හා ඇළුමිනියම් භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | විසිතුරු මසුන් අලෙවිය | 350 0 | 550 0 | 700 0 |
| 08. | ඇස් කණ්නාඩි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කැසට් පට, වීඩියෝ පට විකිණීම හා බදු දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවහන් නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රෙදිපිළි හා නිමි ඇඳුම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යතුරු පැදි විකිණීම | 750 0 | 1,500 0 | 3,000 0 |
| 14. | යතුරුපැදි අමතර කොටස් විකිණීම | 350 0 | 750 0 | 1,000 0 |
| 15. | යතුරුපැදි අලුත්වැඩියාව | 500 0 | 1,000 0 | 2,000 0 |
| 16. | ස්වර්ණාභරණ නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කොහු ආශ්‍රිත නිෂ්පාදන | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 18. | යාන්ත්‍රික පොල්තෙල් මෝල | 500 0 | 1,000 0 | 1,500 0 |
| 19. | මෝටර් රථ අමතර කොටස් | 500 0 | 1,000 0 | 3,000 0 |
| 20. | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ෆයිබර් ග්ලාස් වැඩපළ | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගඩොල් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ලී වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලී මෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 25. | පොල්කටු අඟුරු නිෂ්පාදනය, විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | පොල් ලී මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | තීන්ත හා වාර්නිෂ් | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පුවත්පත් අලෙවිය | 500 0 | 600 0 | 800 0 |
| 29. | ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර සහ අනෙකුත් විදුලි උපකරණ විකිණීම | 750 0 | 1,500 0 | 3,000 0 |
| 30. | ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර සහ අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | රටබීම හල | 1,800 0 | 2,000 0 | 3,000 0 |
| 32. | බටහිර බෙහෙත් ද්‍රව්‍ය විකිණීම (ෆාමසි) | 600 0 | 800 0 | 1,000 0 |
| 33. | ආයුර්වේද බෙහෙත් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | විසිතුරු භාණ්ඩ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පොත්හල | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ශබ්ද විකාශන යන්ත්‍ර බදු දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පැරණි යකඩ බඩු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ඔරලෝසු විකිණීම සහ අළුත්වැඩියාව | 350 0 | 550 0 | 750 0 |
| 39. | හාඩ්වෙයාර් | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | කම්මල | 350 0 | 500 0 | 800 0 |
| 41. | ප්‍රචාරක දැන්වීම් නාම පුවරු සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | සහල් විකිණීම | 250 0 | 350 0 | 400 0 |
| 43. | සුරුට්ටු දුම්කොළ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | පින්තූර රාමු කිරීම | 450 0 | 650 0 | 850 0 |
| 45. | ඡායා පිටපත් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | පරිගණක අලෙවිය හා අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ප්ලාස්ටික් ස්ටිකර්, නාම පුවරු නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | වඩු මඩු | 350 0 | 550 0 | 750 0 |
| 49. | සිසිල් බීම, පළතුරු බීම, අයිස්ක්‍රීම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පැළ තවාන් (විසිතුරු මල්පැළ සහ වෙනත් පැළ වර්ග) | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | එළවළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සන්නිවේදන මධ්‍යස්ථාන/සන්නිවේදන සේවා | 500 0 | 750 0 | 1,000 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| *අ.අ.* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 53. | ලොතරැයි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ස්වයංසේවා වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | කුෂන් වැඩපළ | 350 0 | 550 0 | 750 0 |
| 56. | ඇඹරුම්හල | 400 0 | 600 0 | 800 0 |
| 57. | කොප්පරා නිපදවීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන වඩුමඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | අභ්‍යාස පොත් නිෂ්පාදනය | 400 0 | 600 0 | 750 0 |
| 61. | පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | ටයර් ටියුබ් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ටයර් ටියුබ් වෝල්කනයිසිං | 600 0 | 800 0 | 1,000 0 |
| 65. | ටයර් ටියුබ් අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | සුළු අපනයන භෝග වෙළඳාම | 350 0 | 550 0 | 750 0 |
| 67. | පිත්තල බඩු නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | පා පැදි විකිණීම සහ පා පැදි අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | පා පැදි අලුත්වැඩියාව | 300 0 | 450 0 | 700 0 |
| 70. | පුද්ගලික වෙළඳපොළ | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ඡායාරූප ශාලාව | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | කොහුමෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 73. | කළුගල් වල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 74. | කළුගල් මෝල | 750 0 | 1,500 0 | 3,000 0 |
| 75. | පුද්ගලික ළදරු පාසල | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | තොග සහ සිල්ලර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | තොග වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ඉන්ධන ගබඩාකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | මැටි භාණ්ඩ නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | සත්ත්ව ආහාර ගබඩා කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | බීරළු, කැටයම් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | කොහු හෝ රබර් මෙට්ට නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | තේ කොළ ඇසුරුම් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | පැණි හකුරු නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | සමුපකාර ප්‍රාදේශික වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | කළුගලින් සකසන ලද නාම පුවරු සමරු ඵලක සකස් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | රබර් සීල් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | බුලත්, පුවක්, හුණු, දුම්කොළ | 550 0 | 650 0 | 1,000 0 |
| 89. | අභ්‍යාස පොත්, පාසල් උපකරණ | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | තිර රෙදි මැසීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | ලිහිසි තෙල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | සිමෙන්ති අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | රෙදිපිළි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | බෑග් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | පැණි හකුරු නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | ජංගම වෙළඳසැල | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | දියපොල් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | කොහු ඉදල් නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

**2013 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම**

2013 වර්ෂයේ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තු පැනවීමට අදාලව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී විෂයාංක 8.1 (ඇ) යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තියෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2013 වර්ෂයේ දී, මෙහි පහත උපලේඛනයේ නිරූපිත යම් කර්මාන්තයක් සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කර ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත I වැනි තීරුවේ සඳහන් සීමාවන් ඇතුළත වන අවස්ථාවක II වැනි තීරුවේ අනුරූප සටහනේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් පනවා අයකර ගත යුතු යැයි බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| | *රු. ශත* |
| රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| රු. 1,500 ඉක්මවන අවස්ථාවක | 1,000 0 |

1. තේ කෝපි කඩ
2. ආපනශාලා
3. බේකරි
4. පළතුරු විකිණීම
5. රසකැවිලි නිපදවීම/විකිණීම
6. මුද්‍රවන ලද කිරි වෙළඳාම
7. මාළු විකිණීම
8. මස් විකිණීම
9. හෝටල
10. බාබර් සාප්පු
11. ලොන්ඩ්‍රි
12. අයිස් කර්මාන්තශාලා
13. ගවගාල්

*අප්‍රසන්න වෙළඳාම :*

1. වාහන පින්තාරු කිරීම
2. කුකුළන්, ඌරන් ඇති කිරීම (මස් පිණිස/බිත්තර පිණිස)
3. හුණු පෝරණු
4. රබර් නිෂ්පාදනය කිරීම ගබඩා කිරීම
5. යෝගට් නිෂ්පාදනය
6. මල් ශාලාව

*අන්තරාදායක වෙළඳාම :*

1. ගෑස් අලෙවිය
2. විදුලි පෑස්සුම්වැඩ
3. ශීතකරණ අලුත්වැඩියාව

*අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම :*

1. ගරාජ්
2. යතුරු පැදි අලුත්වැඩියාව
3. වී මෝල

10-376/3

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 8.1(ඊ) සහ 2012.09.11 දිනැති සභා රැස්වීමේ සංශෝධනයන්ට යටත්ව පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 01%ක බද්දක් පනවා අයකළ යුතු බවටත්, එකී බද්ද ඉඩම විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-376/6

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 8.1(අ) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2013 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2012 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2013 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට දහතුනක (13%) ක වරිපනමක් 2013 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-376/1

---

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ අගෝස්තු මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 8.1(අ) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2013 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. කේ. කසුන්,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

*(අ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ අක්කර බද්ද පැනවීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* (ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් 05කට අඩු වූ සෑම ඉඩමක් මත 2013 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

*(ආ)* හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2013 වර්ෂය සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට බද්දට යටත් තැනැත්තන්ට විධානකළ යුතු යැයි ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

10-376/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය … … … … … … | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස … … … … … … | 580 00 | 3,120 00 |
| III වැනි කොටස … … … … … … | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 890 00 | 2,400 00 |
| V වැනි කොටස … … … … … … | 860 00 | 420 00 |
| VI වැනි කොටස … … … … … … | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය … … … … … … | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2012.11.02 | සිකුරාදා | 2012.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.09 | සිකුරාදා | 2012.10.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.11.16 | සිකුරාදා | 2012.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.23 | සිකුරාදා | 2012.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.30 | සිකුරාදා | 2012.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2012.12.07 | සිකුරාදා | 2012.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.14 | සිකුරාදා | 2012.11.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.21 | සිකුරාදා | 2012.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.28 | සිකුරාදා | 2012.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීචන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.